# 58

## මිතුරුතුමෝ දුක සැප දෙකෙහිම.....

*මුතුබණ්ඩා අත්තනායක*

නූතන සිංහල සාහිත්‍යය පෝෂණය කිරීම සඳහා දයක වූ සාහිත්‍යවේදීන් රාශියක් අතුරින් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කුලතිලක කුමාරසිංහ සූරීන්ට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. ශ්‍රී ලංකාව පුරා විසිර පැතිරී සිටින විද්වතුන්, කලාකරුවන්, ආචාර්යවරුන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යශිෂ්‍යාවන් හා පාඨකයන් අතර ඔහුගේ නම අතිශයින් ප්‍රචලිත ය. මෙයට ප්‍රධානතම හේතූන් වනුයේ සිංහල සාහිත්‍යයේ උන්නතිය උදෙසා පොත් සියයකට අධික සංඛ්‍යාවක් ලියා පළ කිරීමත්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් දසදහස් ගණනකට හරවත් දේශන පැවැත්වීමත්, රූපවාහිනී වැඩසටහන් පැවැත්වීමත්, පුවත්පත් ලිපි හා සාකච්ඡා මගින් පාඨකයා දැනුවත් කිරීමත් යනාදි කරුණු ය. කෙටිකතා කලාව, නවකතා කලාව, පද්‍ය සාහිත්‍යය, පරිවර්තන, සංස්කරණ, ජපන් නාට්‍ය කලාව හා විශේෂයෙන් කෙටිකතා විචාරය ආදි ක්ෂේත්‍රයනට ඔහුගෙන් සිදුව ඇති සේවය ඉමහත් ය. එබැවින් ඔහුගේ ශාස්ත්‍රීය සේවය පිළිබඳ ව පළ කෙරෙන උපහාර ග්‍රන්ථයකට ලිපියක් ලිවීමට අවස්ථාව ලැබීම පිළිබඳ ව මම පෞද්ගලික ව සතුටට පත්වෙමි.

දකුණු ලක මාතර පුරවරයෙහි නායිමන නම් වූ සුන්දර පිටිසර ගම් පියසක ජන්ම ලාභය ලැබූ කුලතිලක කුමාරසිංහයන් ගමේ පාසලේ මූලික අධ්‍යාපනය ලබා ඉන් අනතුරුව ගාල්ලේ මහින්ද විද්‍යාලයට ඇතුළු වනුයේ වර්ෂ 1965 දී ය. වර්ෂ 1969 අප්‍රේල් මස පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාග ඉහළින් සමත් වන කුමාරසිංහයෝ මහින්දයේ නොමැකෙන සිහිවටනයක් තැබූහ. ඒ 1969 වර්ෂයේ හොඳ ම උසස් පෙළ ප්‍රතිඵලය ලබා ගැනීමෙන් "අරඹෙවෙල" රන් පදක්කම හිමි කර ගැනීමෙනි. එය මහින්දයේ සිහිවටනයක් පමණක් නොව ඔහුගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යයක් ද වූයේ යයි කීම අතිශයෝක්තියක් නො වේ.

1969 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දී කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට වරම් ලබන කුමාරසිංහ පාසල් සිසුවා එම සරසවියේ උපාධි අපේක්ෂකයෙකු බවට පත්වෙයි. සරසවියට ඇතුළු වූ පළමු වසරේ මුල් භාගයේ දී සිට ම මා සමඟ ඉතාමත් ම කුළුපග ව මිතුරුදමින් වෙළුණ මේ නව යොවුන් තරුණයා මගේ සුමිතුරෙකු බවට පත්වූයේය.

ගමේ ඉපිද කැලණි සරසවියට පැමිණි අපට එම ප්‍රදේශය හෝ පුද්ගලයන් පිළිබඳව හෝ එතරම් අවබෝධයක් නො වීය. එහෙයින් විවේකය ලැබෙන විටදී අප දෙදෙනා තවත් යහළුවන් සමඟ දළුගම, තොරණ හන්දිය, කිරිබත්ගොඩ, මහර, කඩවත, වේවැල්දූව, උණ පඳුර හංදිය, ෆ්‍රැන්සිස් ලේන්, පට්ටිය හන්දිය, පැලියගොඩ ආදි අවට ප්‍රදේශවල ඇවිදීමට පුරුදු වූයෙමු. පෝය දිනවල දී කැලණිය පන්සලට යාම ද අපගේ සිරිතක් විය.

සරසවියට ඇතුළු වූ පළමු වසර අවසානයේ දී පවත්වනු ලබන කලා යෝග්‍යතා පරීක්ෂණය ඉහළින් සමත් ව සිංහල විශේෂවේදී උපාධියක් දිනා ගැනීම මගේ අපේක්ෂාව බව කුමාරසිංහයෝ මා සමඟ පැවසූහ. අපි හැකි තරම් පොතපත පරිශීලනය කළෙමු. දේශන හෝ අභ්‍යාස පන්ති නොපැවැත්වෙන බොහෝ වේලාවන්හි දී අප දෙදෙනා සොයාගත හැකි වූයේ පුස්තකාලය තුළ දී ය.

කාලය කෙමෙන් කෙමෙන් ගෙවී ගොස් ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණයට මුහුණ දීමේ අවස්ථාව ද එළඹිණි. කුලතිලක කුමාරසිංහ නම් වූ උපාධි අපේක්ෂකයා ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණයෙන් සිංහල විෂය සඳහා 'ඒ' සාමර්ථ්‍යයක් ලබා ගෙන සිංහල විශේෂවේදී උපාධි පාඨමාලාව අධ්‍යයනය සඳහා තේරුණි.

මම විශේෂවේදී උපාධිය සඳහා 'භූගෝල විද්‍යාව' විෂය තෝරාගතිමි. ඒ හරියට ම වර්ෂ 1970 දී ය.

සරසවි ජීවිතයේ දෙවන වසරේ දී කිසියම් දිනෙක අප දෙදෙනා කතාබහක යෙදී සිටින අතර මා මිත්‍ර කුමාරසිංහයන් මා සමඟ පැවසූ වදනක් අද මෙන් මා සිහියට නැගෙයි.

> **"මගේ නම් එක ම බලාපොරොත්තුව කොහොම හරි ෆස්ට් ක්ලාස් එකක් ගන්න එක. ඔයත් ෆස්ට් එකක් ම ගන්න ට්‍රයි කරන්න."**

කාලය දින, සති, මාස, අවුරුදු බවට පෙරළෙමින් ඇදී ගියේ ය. 1971 අප්‍රේල් කැරැල්ල සිදුවනුයේ ද අප සරසවි අධ්‍යාපනය ලබන වකවානුවේ දී ම ය. විදුලකර සරසවිය වසා දැමිණි. එය ජනතා විමුක්ති පෙරමුණේ කැරලිකරුවන්ගේ පුනරුත්ථාපන කඳවුරක් බවට පත් විය. මාස 6ක පමණ කාලයක් අපට ගෙවල්වලට වී සිටීමට සිදු විය. අනතුරුව සවස් වරුවල දී කොළඹ ආනන්ද විද්‍යාලයේ දී දේශනවලට සහභාගි වීම සඳහා පහසුකම් සැලසිණි.

කැලණි සරසවියේ පුනරුත්ථාපන කඳවුර ඉවත් කිරීමෙන් පසුව නැවතත් සරසවිය විවෘත වී අපට සිරිත් පරිදි අධ්‍යාපන කටයුතු කරගෙන යාමට ඉඩකඩ සැලසිණි. 1973 වර්ෂය අවසානයේ දී අවසන් වසර විභාගය පවත්වන බැවින් එය අපට කාර්යබහුල කාලයක් විය. විභාගය අවසන් විය. අපි සමුගතිමු.

දෙවන වසරේ දිනෙක කුමාරසිංහයන් මා සමඟ පැවසූ වදන් ඒ අයුරින් ම සනාථ කරමින් උපාධි ප්‍රතිඵල ලේඛනය පිරික්සන අපට පෙනුණේ ඔහු සිංහල විශේෂවේදී උපාධිය සඳහා ප්‍රථම පංතියේ සාමර්ථ්‍යයක් ලබාගෙන ඇති බව ය. එම වසරේ දී සිංහල විෂය සඳහා

පළමු පෙළ සාමර්ථ්‍යයක් ලබා තිබුණේ ඔහු පමණි. ඔහුගේ ජයග්‍රහණයන් පිළිබඳ ව මම නිරතුරුව ම සතුටට පත්වීමි. කුමාරසිංහයන්ගේ ජීවිතයේ ශීඝ්‍ර වර්ධනයක් සිදුවන්නේ මෙතැන් සිට යැයි කිවහොත් එය නිවැරදි යැයි සිතේ.

කුලතිලක කුමාරසිංහයන් කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අංශයේ කථිකාචාර්ය පදවියකට වරම් ලැබූයේ තවත් දිගු ගමනකට මුල පුරමිනි. සහකාර කථිකාචාර්ය පදවියට පත් ඔහු කථිකාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සහාය මහාචාර්ය, මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, පීඨාධිපති හා වැඩබලන උපකුලපති යනාදි තනතුරු දරමින් මේ දක්වා අවුරුදු 38ක පමණ කාලයක් සිංහල අංශයට මහඟු මෙහෙවරක් ඉටු කර ඇත. විවිධ වැඩමුළු සඳහා කැලණි සරසවිය නියෝජනය කරමින් රටවල් රාශියකට යාමේ භාග්‍යය ඔහුට උදා විය. තව ද ජපන් භාෂාව පිළිබඳ විද්වතෙකු වූ ඔහු ජපන් නාට්‍ය කලාව පිළිබඳ පර්යේෂණ කිරීම සඳහා කීපවරක් ම ජපානයට ගියේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් **නෝ නාට්‍ය ඉතිහාසය, ෆුෂිකදෙන්, ජපන් ජන නාට්‍ය කලාව** වැනි කෘතීන් රාශියක් ඔහු අතින් බිහි වූ අතර ඒවායින් ජපන් නාට්‍ය කලාව පිළිබඳ ව අධ්‍යයනය කරන විද්‍යාර්ථීන්ට විශාල මෙහෙයක් ඉටු වූයේ ය.

1973 දී පමණ උපාධි අපේක්ෂකයෙකුව සිටි අවධියේ රචනා කොට පළ කරන ලද **නැත ලොවේ අන් රසඳුනා** නම් වූ කාව්‍යය ග්‍රන්ථය ඔහු විසින් පළ කරන ලද මුල් ම කෘතිය නිසාත්, එම පද්‍ය සංග්‍රහයට ඔහුගේත් මගේත් අත්දැකීම් පාදක කොට ගත් පද්‍ය පංතියක් ද ඇතුළත් වීම විශේෂත්වයක් වූ නිසාත්, එම කෘතිය කෙසේවත් අමතක කළ හැකි නො වේ. මෙම පොතෙන් ආරම්භ වූ ලේඛන කලාව ආශ්‍රයෙන් පොත් සියය ඉක්මවා ලිවීමට ඔහුට හැකි වීම සියලු ම සාහිත්‍යවේදීන්ගේ සතුටට කරුණක් වනවා නොඅනුමාන ය.

"නැණැති දනන් හට මද ගුණයක් කළද
පවතී ගල කෙටූ අකුරක් මෙන් නිබඳ"

යනාදි වශයෙන් අලගියවන්න මුකවෙටි තුමා සුභාෂිතයේ දී කියා ඇති කවි දෙපදය මගේ සිහියට නැගෙනුයේ ඔහු නිහතමානී ව මිතුරනට බොහෝ උපකාර කරනු ලබන විරල ගුණාංගයන් ඇති පුද්ගලයෙකු බැවිනි. ඔහු විසින් ලියන ලද බොහෝ ශාස්ත්‍රීය පොත්පත් පිළිගන්වා ඇත්තේ තමා ඉගෙන ගත් ආචාර්ය, මහාචාර්යවරුන් වෙතය. ඒ අතරතුරේ දී මිතුරනට ගරු කිරීමක් වශයෙන් ඔහු විසින් ලියන ලද නූතන සාහිත්‍ය කලා විමර්ශන-ලිපි නම් වූ කෘතියේ -

**පිළිගැන්වීම**

**ළබැඳි සුමිතුරු**
**මුතුබණ්ඩා අත්තනායක**
**මහත්මාට**



යනුවෙන් සඳහන් කිරීම මා කිසිසේත් ම බලාපොරොත්තු වූවක් නො වේ. එහෙත් එය එසේ සිදු වී ඇත.

පොතපත ලිවීම සඳහා ආධුනිකයන්ව පෙලඹවීමත්, ඔවුනට උපකාර කිරීමත් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කුලතිලක කුමාරසිංහයන්ගේ තවත් උදාර ගුණාංගයකි. කෙතරම් කාර්ය බහුල ජීවිතයක් ගත කළ ද ඔවුනට අතහිත දීම සඳහා කාලය මිඩංගු කිරීම ඔහුට සතුටකි.

පහනින් පහන් සිය ගණනක් ඇවුළුව ද
එපහන් සිලෙහි අලු අඩු නොව දිලෙන ලෙ ද
ලොව අන් සතුන් ගුණ පළ කරමින් නිබ ඳ
සුපසන් ගුණෙන් වැජඹෙති සුදනෝ පබ ද

එක පහනින් පහන් සිය ගණනක් දැල්වූව ද ඒ පහන් සිලෙහි ආලෝකය අඩු නොවන්නාක් සේ සුදන ගුණ ඇති උතුම් පුරුෂයෝ නිරතුරුව ම ලෝකයේ අනෙකුත් ජනයාගේ ගුණ කියමින් ඉතා ප්‍රසන්න ගුණයෙන් අන්‍යයන් අතර වැජඹෙති. සරසවියක් තුළ දී විද්‍යාලෝකය ලබා දීම තමාගේ වෘත්තීය කොටගත් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කුලතිලක කුමාරසිංහයන්ට ඉහතකී කවියේ අර්ථය මැනවින් ම ගැළපෙතැයි මම විශ්වාස කරමි. කැලණිය සරසවියේ කථිකාචාර්ය පදවියක් දරමින් සිටින අවධියේ ආදායම් බදු දෙපාර්තමේන්තුවේ තක්සේරු නිලධාරි පත්වීමක් ලැබ එහි යන කුලතිලක කුමාරසිංහයන් එම රැකියාවට ආයුබෝවන් කියා ආපසු සුපුරුදු රැකියාවට ම පැමිණෙන්නේ පහනින් පහන් දැල්වීමේ වැදගත්කම හා ඔහුට යා යුතු ව තිබූ ඉදිරි ගමනට එය මහත් බාධාවක් වන බව වටහාගත් බැවිනැයි මම සිතමි.

සිංහල සාහිත්‍යයේ විවිධ ක්ෂේත්‍ර පිළිබඳ ව පෘථුල දැනුම් සම්භාරයක් රැස්කොට ගෙන ඇති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කුලතිලක කුමාරසිංහයන් ඉමහත් සේවයක් කර ඇත්තේ කෙටිකතා කලාව හා විචාරය සඳහා යැයි කිවහොත් එය නිවැරදි ය. ඒ බව **සිංහල කෙටිකතාවේ වර්ධනීය අවස්ථාවක්, හේමපාල මුනිදාසගේ කෙටිකතා, ටී.ජී.ඩබ්. ද සිල්වා සහ පුවත්පත් කෙටිකතා, ඩබ්.ඒ. සිල්වා කෙටිකතා, සිංහල කෙටිකතාවේ ප්‍රභවය, සිංහල කෙටිකතාවේ කලාත්මක මුහුණුවර හා මාර්ටින් වික්‍රමසිංහ, කෙටිකතා විචාර මූලධර්ම හා සම්ප්‍රදාය, ගුණදාස අමරසේකර කෙටිකතා විමර්ශන, අද්‍යතන සිංහල කෙටිකතා 1, 2, ජී.බී. සේනානායක කෙටිකතා, ජපන් නවකතා හා කෙටිකතා සාහිත්‍යය, මිණිවන් පී. තිලකරත්න - කෙටිකතා විමර්ශන, සිංහල කෙටිකතාවේ ප්‍රභවය හා කලාත්මක විකාශනය, සිංහල කෙටිකතා සංවාද විමර්ශන, ඇරැව්වල නන්දිමිත්‍රගේ කෙටිකතා විමර්ශන, සිංහල කෙටිකතාවේ ප්‍රභවය හා විකාශනය 1,2,3,4,5,6,7 හා 8, සමාජය, යථාර්ථය හා කෙටිකතාව** යනාදි ග්‍රන්ථ පරිශීලනය කරන්නකුට පෙනී යයි. තවද ඕනෑ ම විද්වතෙකුට මෙම ශාස්ත්‍රීය ග්‍රන්ථ රාශිය අධ්‍යයනය කරන විට පසක් වනුයේ කෙටිකතා කලාව හා විචාරය පිළිබඳ ව මෙතරම් කෘති රාශියක්

විද්‍යාර්ථීන්ට දයාද කරන ලද වෙනත් කිසිදු ලේඛකයකු නොමැති බවයි. සරසවි සිසුන්ට, ආධුනික ලේඛකයන්ට, විචාරකයන්ට හා කෙටිකතා කලාව පිළිබඳව උනන්දුවක් දක්වන උගතුන්ට හා රසිකයන්ට මෙම ග්‍රන්ථවලින් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කුලතිලක කුමාරසිංහයන් විසින් ඉටු කරනු ලැබ ඇති මහඟු සේවය ප්‍රශංසනීය වේ.

කුලතිලක කූමාරසිංහ යනු ඉතාමත් සරල දිවි පෙවෙතකට නිරතුරුවම නැඹුරු වූ නිහතමානී විද්වතෙකි. ඔහු ඕනෑ ම අයෙකුට තමා හමුවී අධ්‍යාපනික ගැටලු, සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රය පිළිබඳව ගැටලු ආදිය සාකච්ඡා කොට ඒවා නිරාකරණය කරගැනීම සඳහා නිතර දොර විවෘතව තබා ඇති ප්‍රඥාවන්තයෙකි.

වරෙක පශ්චාත් උපාධි අපේක්ෂිකාවක විසින් ලියන ලද උපාධි නිබන්ධනයක සඳහන් කොට තිබූ කරුණු සනාථ කරගැනීම සඳහා කුලතිලක කුමාරසිංහ මහැදුරු තුමා මා සමඟ පොළොන්නරුවේ නටබුන් අතර දින දෙකක් ම ගත කළේය. ඔහු උසස් අධ්‍යාපනය ලබන්නන් පිළිබඳව කෙතරම් උනන්දුවකින් අදාළ කාර්යයන් අකුරට ම කරවීමට ගත් උත්සාහය මෙයින් පැහැදිලි වෙයි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කුලතිලක කුමාරසිංහයන් පිළිබඳවත්, ඔහුගේ පොතපත පිළිබඳවත්, විවිධ මහාචාර්යවරුන් විසින් පළකරනු ලබන අදහස් මඟින් තවදුරටත් ඔහු පිළිබඳව කරුණු වටහාගැනීමට පාඨකයන්ට ඉඩ සැලසී ඇත.

**නූතන සිංහල සාහිත්‍ය කලා විමර්ශන ලිපි** ග්‍රන්ථයේ මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කුලතිලක කුමාරසිංහයන් පිළිබඳව මෙසේ කියයි.

"මහාචාර්ය කුලතිලක කුමාරසිංහ අප අතර සිටින නමක් දිනාගත් වැදගත් විචාරකයෙකි. සිංහල කවිය, කෙටිකතාව, නවකතාව මෙන් ම ජපන් නාට්‍ය මුල් කරගෙන ද විචාර ග්‍රන්ථ සපයා හෙතෙම නොමඳ පාඨක ප්‍රසාදය දිනාගත්තේය.

විචාරකයෙකු හැටියට ඒ මහතා සතු අන් බොහෝ විචාරකයන්ට නැති වැදගත් ගුණාංග කිහිපයක් වේ.

* සාහිත්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධය
* හේතුසාධක දක්වමින් තම මතය සනාථ කිරීම
* අන් අයට පහර දෙන ආක්‍රමණශීලී විචාර ක්‍රමයක් හෝ දර්ශනයක් පිහිටකර නොගැනීම
* අපක්ෂපාතී, සංයමයෙන් යුත් විඥනය
* ඉතා විස්තර සහිත කරුණු අඩංගු වූ විචාර විවරණය

ඉතා ප්‍රසන්න ශෛලියකින් හා සානුකම්පික දෘෂ්ටියකින් විචාර කාර්යය සිදු කරන ඒ මහතා සාහිත්‍ය නිර්මාණයේ කලාත්මක අගය ගැන මිස ඒ කතාව රචනා කළ පුද්ගලයා සම්බන්ධ සාහිත්‍ය සීමාවලින් එහා, කෙටිකතා පරමාර්ථයට නොවැදගත් කාරණා ගැන තම උනන්දුව



යොමු නො කරයි. සිංහල කෙටිකතාව හා එහි වර්ධනය ගැන සැලකිලිමත් වන සාමාන්‍ය පාඨකයාට ද, විචාරය කුමක් ද, එය කළ යුත්තේ කෙසේ ද කියා වටහා ගැනීමට සෑහෙන ආලෝක ධාරාවක් මේ ග්‍රන්ථයෙන් ලැබෙන්නේය"

දෙස් විදෙස්හි සාහිත්‍යධරයන්ගේ නොමඳ ආදරයට පාත්‍ර වූ කීර්තිමත් ලේඛකයකු වූ මහාචාර්ය විමල් දිසානායක මහතා, කුලතිලක කුමාරසිංහයන්ව විචාරකයෙකු වශයෙන් අගැයීමට ලක් කර ඇත්තේ පහත සඳහන් අයුරිනි.

> **"කෙටිකතාවේ වර්ධනය සඳහා සූක්ෂ්මදර්ශී විචාරකයන්ගේ මෙහෙය අත්‍යවශ්‍ය වේ. කෙටිකතාවක අන්තර්ගතය, භාෂා මාධ්‍යය, සන්දර්භය, ජීවන දැක්ම, දෘෂ්ටිවාදය සියුම් විශ්ලේෂණයට ලක් කරමින්, එහි විචාරකයා පාඨකයන්ගේ රසඥතාව හා බුද්ධි පරිමණ්ඩලය පුළුල් කිරීමට යත්න දරයි. නිපුණ සාහිත්‍යවේදියෙකු වන මහාචාර්ය කුලතිලක කුමාරසිංහ මහතා වර්තමාන කෙටිකතාව පිළිබඳව අලුත් ග්‍රන්ථයෙන් විචාරකයෙකුගෙන් අපේක්ෂිත කාර්යය මැනවින් ඉටු කොට ඇත. ගැඹුරු සංස්කෘතික විඥනයකින් යුතුව කුමාරසිංහ මහතා නවීන සිංහල කෙටිකතා ගණනාවක් විවරණය කොට ඇත්තේ පාඨකයන්ගේ චින්තන ක්ෂිතිජය විස්තාරණය වන අයුරිනි"**

(අද්‍යතන සිංහල කෙටිකතා - ද්විතීය භාගය)

මහාචාර්ය විමල් දිසානායකයන්ගේ මෙම ප්‍රකාශයෙන් කුමාරසිංහ සූරීන්ගේ විචාර කලාව සිංහල සාහිත්‍යෝන්නතිය සඳහා කෙතරම් දයකත්වයක් ලබාදී ඇත්දැයි අපට අවබෝධ කරගත හැකිය. ඔහු මේ දක්වා පැමිණි ගමන් මග රෝස මල් ඇතිරූ සුවබර එකක් නො වේ. ඔහුට තවත් වසර ගණනාවක් සිංහල සාහිත්‍ය කලා කෙත පෝෂණය කරමින් ඉදිරියට යාම සඳහා දීර්ඝායුෂ ලැබේවා යනු අපගේ පිවිතුරු පැතුමයි.